# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

09 ශ්‍රේණිය | ඉතිහාසය | ඒකකය 05 - ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය.

## I කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලංකාවේ පැවති රාජාණ්ඩු පාලන ක්‍රම බිඳ වැටුණේ,

(1). 1848 දීය (2). 1815 දීය (3). 1948 දීය (4). 1796 දීය

02. කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල කැපී පෙනෙන ලක්ෂණයක් නොවන්නේ,

(1). ව්‍යවස්ථාදායක හා විධායක කාරක සභා පිහිටුවීම.

(2). උඩරට හා පහතරට ප්‍රදේශ තවදුරටත් වෙන් කර පාලනය කිරීම.

(3). අනිවාර්ය රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.

(4). ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම.

03. කෝල්බෲක් යෝජනා අනුව නීති සම්පාදනය සඳහා පිහිටුවන ලද ව්‍යවස්ථාදායක සභාවට ඇතුළත් සාමාජිකයන් ලණන වූයේ,

(1). 10 කි (2). 15 කි (3). 20 කි (4). 12 කි

04. කෝල්බෲක් යෝජනාවලට අනුව පිහිටුවන ලද විධායක සභාවේ මූලාසනය දරන ලද්දේ,

(1). යටත් විජිත ලේකම්වරයා (3). රජයේ මිනුම්පතිවරයා

(2). අග්‍රාණ්ඩුකාරවරයා (4). ආණ්ඩුකාරවරයා

05. කෝල්බෲක් යෝජනා අනුව පරිපාලන කටයුතු සඳහා ලංකාව පළාත් කීයකට බෙදන ලද්දේ ද?

(1). 6 කට (2). 5 කට (3). 9 කට (4). 4 කට

06. 1908 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව පිළිබඳව මුල්වරට විධිමත් සංදේශයක් යටත් විජිත භාර ලේකම්වරයාට ඉදිරිපත් කළේ,

(1). පොන්නම්බලම් අරුණාචලම් මහතා (3). සර් ජේම්ස් පීරිස් මහතා

(2). පොන්නම්බලම් රාමනාදන් මහතා (4). එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

07. කෲව්-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මෙරටට ලබා දෙන ලද්දේ,

(1). 1913 දීය (2). 1912 දීය (3). 1908 දීය (4). 1910 දීය

08. කෲව්-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ මුල් වරට ඡන්ද බලයෙන් ව්‍යවස්ථාදායක සභාවට පත් වූයේ,

(1). පොන්නම්බලම් රාමනාදන් මහතා (3). සර් ජේම්ස් පීරිස් මහතා

(2). පොන්නම්බලම් අරුණාචලම් මහතා (4). ඩී.එස්. සේනානායක මහතා

EXAMRESULTS.LK

09. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය අනුව ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින් ගණන,

(1). 37 කි (2). 20 කි (3). 32 කි (4). 30 කි

10. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නිල කාලය,

(1). අවුː 3 කි (2). අවුː 4 කි (3). අවුː 6 කි (4). අවුː 5 කි

- **පහත දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11. 1910 වර්ෂයේ දී ලංකාවේ ආණ්ඩුකාර ධූරය දරන ලද්දේ විලියම් මැනිං මහතාය. (   )

12. මැනිං ඩෙවොන්ෂියර් ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් ගණන 49 කි. (   )

13. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ අනුව පිහිට වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කථානායක ධූරය හෙබවූයේ ඒ.එෆ්. මොලමුරේ මහතාය. (   )

14. ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය හිමි වූයේ මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුලිනි. (   )

15. දෙවෙන ලෝක සංග්‍රාමය ආරම්භ වීම 1929 දී සිදු විය. (   )

- **හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. සෝල්බරි ආණ්ඩුක්‍රමය මෙරට ක්‍රියාත්මක වූයේ ............................................... (1945 / 1947) වර්ෂයේ දීය.

17. මෙරට ප්‍රථම ආණ්ඩුකාරවරයා වශයෙන් කටයුතු කළේ ........................................................... (විලියම් මැනිං / හෙන්රි මන්ක් මේසන් මුවර්) ය.

18. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් මණ්ඩලයේ නායකත්වය ලැබුණේ ......................................................... (අග්‍රාණ්ඩුකාරවරයාට / අගමැතිවරයාට) ය.

19. නිදහස් ලංකාවේ පළමු අගමැතිවරයා වූයේ ........................................................... (ඩඩ්ලි සේනානායක / ඩී.එස්. සේනානායක) මහතා ය.

20. ශ්‍රී ලංකාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය හිමි වූයේ ............................................. (1953 / 1955) වර්ෂයේ දීය.


## <u>II කොටස</u>

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පහත පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



A



B

(1). මෙහි A රූපයෙන් දැක්වෙන්නේ කවුද? (ල.02)

(2). මෙතුමා සභාපති ධූරය දැරූ සංගමයේ නම කුමක්ද? (ල.02)

(3). එම සංගමයේ අරමුණු 2ක් දක්වන්න. (ල.02)

(4). ඉහත B රූපයෙන් දැක්වෙන්නේ කවුද? (ල.02)

(5). ඔහුගේ ප්‍රධානත්වයෙන් පත් කළ කොමිසමේ නම කුමක්ද? (ල.02)

(6). එම කොමිසම පත් කළ වර්ෂය නම් කරන්න. (ල.02)

02. (1). කෝල්බෲක් කොමිෂන් සභාව පත් කිරීමට බලපෑ හේතු 3ක් පැහැදිලි කරන්න. (ල.03)

(2). කෝල්බෲක් කොමිසමේ විමර්ශනයට ලක් වූ ක්ෂේත්‍ර 2 නම් කරන්න. (ල.02)

(3). කෝල්බෲක් යෝජනා අනුව පිහිටුවන ලද ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය සටහනකින් දක්වන්න. (ල.05)

(4). ව්‍යවස්ථාදායක සභාව හඳුන්වාදීම තුළින් මෙරට දේශපාලන ක්‍රමයෙහි වැදගත් සන්ධිස්ථානයක් ලෙස කෝල්බෲක් ක්‍රමය වැදගත් වනුයේ ඇයි? (ල.02)

03. (1). කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මෙරට ක්‍රියාත්මක වීමෙන් පසු එම ආණ්ඩුක්‍රමය වෙනස්කම් ඉල්ලා මුල්වරට උද්ඝෝෂණයක් ආරම්භ කළේ කවුද? (ල.02)

(2). කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසු ඉංග්‍රීසි උගත් මධ්‍යම පාන්තික ලාංකික පිරිසක් බිහි වීමට තුඩුදුන් හේතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(3). ලංකා ජාතික සංගමය පිහිටවූයේ කවදාද? (ල.05)

(4). ලංකා ජාතික සංගමයේ අරමුණු වූයේ මොනවාද? (ල.03)

04. (1). ක්‍රෑව්-මැකලම් ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද? (ල.02)

(2). ඩොනමෝර් කොමිසන් සභාව පත් කිරීමට බලපෑ හේතු 3ක් දක්වන්න. (ල.03)

(3). ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ විධායක කාරක සභා 7 නම් කරන්න. (ල.05)

(4). ඩොනමෝර් ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය සටහනකින් දක්වන්න. (ල.02)

05. (1). සෝල්බරි ආණ්ඩුක්‍රමය මෙරට ක්‍රියාත්මක වූ

(a) වර්ෂය දක්වන්න.

(b) සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ 3ක් දක්වන්න. (ල.04)

(2). සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අග්‍රාණ්ඩුකාර තනතුරට,

(a) හිමි බලතල මොනවාද?

(b) එම තනතුර නාම මාත්‍ර විධායක තනතුරක් වූයේ මන්ද? (ල.04)

(3). සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පාර්ලිමේන්තුව,

(a) හැඳින්වෙන නම කුමක්ද? (ල.02)

(b) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන කීයද? (ල.02)

(4). සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පහත දැක්වෙන මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(a) රාජ්‍ය සේවා කොමිසම

(b) අධිකරණ සේවා කොමිසම

(c) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය (ලකුණු 4 බැගින්)

*සැකසුම: පමෝදා හේවාවිතාරණ මිය*